# ශ්‍රී ලංකාවේ පාසල් සඳහා යෝජිත පාසල් පාදක කළමනාකරණ ක්‍රමය තුළ විදුහල්පතිවරුන්ගේ වෙනස් වන කළමනාකරණ භූමිකාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

(ගම්පහ දිස්ත්‍රික්කයේ 1 ඒ බී (1AB ) වර්ගයේ පාසල් නියැදියක් ඇසුරෙන්)

M485
A

UNIVERSITY OF COLOMBO SRI LANKA
26 MAY 2005
LIBRARY

චන්දන කස්තුරිආරච්චි

විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන ( විශේෂ )

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා

University of Colombo Library Sri Lanka

UCLIB
525873

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති උපාධි අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය

2004 ජූලි

## සංක්ෂිප්තය


මෙම අධ්‍යයනයේ ඉලක්කය වූ කලී ශ්‍රී ලංකාවේ පාසල් සඳහා යෝජිත පාසල් පාදක කළමනාකරණ ක්‍රමය තුළ වෙනස් වන විදුහල්පති භූමිකාව විමර්ශනය කිරීම යි.

වර්තමාන විදුහල්පති කළමනාකරණ භූමිකාවේ ස්වභාවය සොයා බැලීම, 1ඒබී (1AB ) වර්ගයට අයත් පාසල්වල වර්තමානයේ දක්නට ලැබෙන පාසල් පාදක කළමනාකරණ ක්‍රමයට ආවේණික ලක්ෂණ සොයා ගැනීම, පාසල් කළමනාකරණයේ නිරතවීමේ දී විදුහල්පතිගෙන් දිස්වන දුර්වලතා සොයා බැලීම සහ එහි දී ඔවුනට බාධා ගෙන දෙන සාධක හඳුනා ගැනීම, පාසල් පාදක කළමනාකරණ ක්‍රමයෙන් අපේක්ෂිත විදුහල්පති කළමනාකරණ භූමිකාව ඉටු කර ගැනීමට අවශ්‍ය උපාය මාර්ග නිර්ණය කිරීම අධ්‍යයනයේ අරමුණු වෙයි.

ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටි සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපන කටයුතු මෙහෙයවන 1 ඒ බී (1AB ) වර්ගයේ පාසල්වලට පමණක් මෙම අධ්‍යයනය සීමා විය. නියැදිය ලෙස එයින් පාසල් අටක් තෝරා ගනු ලැබී ය. මෙම අධ්‍යයනය සඳහා නියැදි සමීක්ෂණ පර්යේෂණ ප්‍රවේශය උපයෝග කොට ගන්නා ලදී; තොරතුරු ලබා ගැනීමට නියැදියට අයත් පාසල්වල සේවය කරන විදුහල්පතිවරුන්, නියෝජ්‍ය/උප/සහකාර විදුහල්පතිවරුන්, ගුරුවරුන්, එම පාසල්වලට සම්බන්ධ දෙමාපියන් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් අහඹු සහ සහේතුක නියැදුම් ක්‍රම භාවිතයෙන් තෝරා ගනු ලැබී ය. සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි සහ ආකල්ප පරීක්ෂණ භාවිතයෙන් ඔවුන් වෙතින් තොරතුරු රැස් කරන ලදී.

රැස් කරන ලද දත්ත, ප්‍රතිශත, වගු, ප්‍රස්තාර සහ සරල සංඛ්‍යාන ක්‍රම භාවිතයෙන් විශ්ලේෂණය හා අර්ථකථනය කරන ලදී.


University of Colombo
Library
Sri Lanka

මෙම අධ්‍යයනයේ අනාවරණ වශයෙන්: පාසල් කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රධානත්වය විදුහල්පතිට හිමි වන නමුත් සමහර තීරණ ගැනීම සඳහා අවශ්‍ය බලතල ඔහුට / ඇයට ලැබී නොමැති බවත්, පාසල් සැලසුම්කරණය සහ සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් විදුහල්පති වෙතින් දුර්වලතා දිස්වන බවත්, සම්පත් හිඟය විදුහල්පති කළමනාකරණ භූමිකාව ඉටු කිරීමට බාධා ගෙන දෙන සාධක අතුරින් ප්‍රධාන සාධකය බවත් හඳුනා ගන්නා ලදී. පාසල් පාදක කළමනාකරණ ක්‍රමයට ආවේණික වූ ලක්ෂණ වැඩි ප්‍රමාණයක් වර්තමාන පාසල් පද්ධතිය තුළ විද්‍යාමාන නො වන බවත් , තීරණ ගැනීම සඳහා අවශ්‍ය බලතල, ස්වාධීනත්වය සහ පුහුණුව පාසල් ප්‍රජාව වෙත ලබා දීම, පාසල් පාදක කළමනාකරණ ක්‍රමයෙන් අපේක්ෂිත විදුහල්පති කළමනාකරණ භූමිකාව සාර්ථක ව ඉටු කර ගැනීමට ගත යුතු උපාය මාර්ග අතුරින් ප්‍රධාන වන බවත් ගෙන හැර දැක්විය හැකි ය.

එස්.බී.එම්.( SBM) ක්‍රමයෙන් අපේක්ෂිත විදුහල්පති කළමනාකරණ භූමිකාව සාර්ථක ව ඉටු කර ගැනීමට, තීරණ ගැනීම සඳහා වන ප්‍රමාණවත් බලතල, ස්වාධීනත්වය පාසලට ලබා දීම සහ පාසලේ සාර්ථකත්වයට අහිත කර වන්නා වූ නීති රීති සංශෝධනය කිරීම මගින් එම අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගත හැකි වන්නේ ය.

ශ්‍රී ලංකාවේ පාසල් කළමනාකරණය සඳහා යෝජිත පාසල් පාදක කළමනාකරණ ක්‍රමය ක්‍රියාවට නැංවීමේ දී වත්මන් විදුහල්පති භූමිකාව සැලකිය යුතු වෙනසකට භාජන වෙයි. එම වෙනස් වන භූමිකාව පිළිබඳ ව කෙරෙන මෙම අධ්‍යයනයෙන් ලැබෙන අනාවරණ පාසල් කළමනාකරණය සම්බන්ධයෙන් තීරණ ගන්නා වූත් , එයට සම්බන්ධිත වූත් සියලු දෙනාට ප්‍රයෝජනවත් වන බව නො අනුමාන ය.

## ABSTRACT

The aim of the present research has been to investigate into the changing role of the Principal of school in the background of the proposed school based management for schools in Sri Lanka.

The objectives of the research under the aims stated above, has been to find out about the nature of the present managerial role of the Principal, to find out the specific features displayed in the school based management system as evident in the present IAB Schools, to find out about the weaknesses displayed by Principals in managing the school and to identify the factors that disrupt his role and to determine strategies that would help the Principal to achieve expected role of the Principal as envisaged by the school based management method.

This study was limited to Sinhala medium I AB schools in the Gampaha district. Eight (08) schools from among them were selected as the sample and the Sample Survey Research Approach was used as the research tool. Information for the study was collected from Principals of the said 08 schools, Deputy / Vice / Assistant Principals, Teachers, Parents of the children of the schools and Zonal Directors of Education, using the Random Sample Survey and attitude test Methods. Information was collected through questionnaires, attitude tests and interviews.

Finally the data thus collected were analyzed and interpreted using Percentages, Tables, Graphs and simple statistical methods.

The findings of the research were: that the Principal has not been entrusted with certain powers he should have got in taking certain decisions, although he holds the headship of the school management process; That in some cases weaknesses were displayed by the Principals in the School Planning and Resource Management. It also identified the scarcity of resources as the main factor affecting the role of the Principal. It also revealed that in some cases, the specific features of the school based Management system were not displayed most of the present schools.

In this context, the study pointed out that the Principals should be given powers necessary to take decisions and the school community to be given independence and training, for the Principals to achieve the ideal role of school management as expected by the school based Management method. The above goals of the S.B.M. Method can be achieved by vesting necessary powers to the Principal, by giving the school necessary independence and by bringing necessary reforms to the rules and regulations that affect the school.

It is evident that, the present role of the Principal undergoes a considerable change in implementing the proposed School based Management reforms. The findings about the changing role of the school management as revealed in this study, will therefore, be of importance to anybody involved in the process of decision taking and policy formulation regarding school management.